## 16 වන පිටෙන් දිවුල්ගනේ සමග

**මම හිතන්නෙ අපේ ගමේ ඇති සෞන්දර්යය තමයි ඔබ ගායකයෙක්, කලාකරුවෙක් කළේ.. එහෙම නේද?**

ඒකත් එක අතකින් ඇත්ත. මම මුලින්ම කිව්වා වගේ අපි ගමේ වින්ද නිදහස තමයි ඒකට හේතුව. ඉගෙන ගන්නවා වගේම ඒ නිදහස අවශ්‍යයි නිර්මාණශීලී මිනිසකු කරන්න. ඔබ මුලින් ඇසූ ප්‍රශ්ණයක් තමයි ඇයි මම ආදරය ගොඩක් නිර්මාණ සඳහා යොදා ගනේනේ කියලා. ආදරේ කියන්නෙ විශ්ව සාධාරණීය ධර්මතාවක්. එය මව්පිය ආදරේ, දරුවන්ට ඇති ආදරේ වගේම තම ආදරවන්තයට වන්තියට ඇති ආදරය ආදී වශයෙන් වර්ග කරන්න පුළුවනි. මම ඒ හැම අංශයක්ම ගැනම ගීත ගායනා කරනවා. අන්දරයායේ, ගමට කලින්, වෙහෙරක් වගේ, ආදී ගීත මව් පියන්ට . මගේ දුවේ ගීතය ලංකාවේ ගොඩක් ජනප්‍රිය ගීතයක්. මේ ගීතය ලියූ රත්න ශ්‍රී ගේ දුවත් විතරක් නෙවෙයි ලෝකයේ සියලුම දුවලා ඉන්න අම්මලා වෙනුවෙන්. කරු, මම ආසම කොටසක් තියෙනවා ඔය ගීතයේ.

ලොව දුන්න දේවල් අද අපිට
හෙට ලොවට පෙරළා දිය යුතුයි
ඔබ මේ ලොවට ආදරේ නම්
ලොවම ඔබට ආදරෙයි

මේ පද ටික විශ්ව සාදාරණීය කියමනක්. මේ ටික අපි හැම කෙනෙකුටම පොදුයි. දුවලට විතරක් නෙවෙයි.

**දැනට ලංකාවේ ප්‍රචාරය වන ගීත ගැන ඔබේ අදහස මොකක්ද.?**

ඇත්තෙන්ම මටත් කියන්න තියෙන්නෙ ඔබ කියන්නා වගේ කණගාටුයි කියලා. පෞද්ගලික ප්‍රචාරක මාධ්‍ය ඔස්සේ ඕනෑම ගීතයක් ප්‍රචාරය කරන්න අද සූදානම්. එහි ඇති ගුණාත්මක බව හිතන්නෙ නැහැ. අපේ කාලේ ගුවන් විදුලියේ ගායකයෙක් වෙන්න සම්මුඛ පරීක්ෂණයකදී කටහඬ අනුව ශ්‍රේණි ගත කරනවා. රජයේ පාසල් වල පවා සිංහල සාහිත්‍යයට තැනක් දීලා නෑ පෙරදා වගේ. ඒ නිසා සාහිත්‍යය සිංහල භාෂාව ගුන දන්නෙ නැති අය ගීත හදන්නේ. අපේ සංස්කෘතිය ගැනවත් දන්නේ නැහැ. පොදු වශයෙන් ඕවායි හේතු. ඒත් මේ ගැන ගොඩක් කතා කළ යුතුව තියෙනවා.**සාකච්ඡා කළේ මහින්ද දිසානායක දිවුල්ගනේ**

## 6 වන පිටෙන්

තිබෙනවා අප විසින් ම රුසියානුවන් මර්ධනය සඳහා අරමුදල් සැපයීම හරහා මෙම ත්‍රස්තවාදීන් පෝෂණය කළ බව. එම අරමුදල් සැපයීමේ දී රුසියානුවන් මර්ධනය කිරීමෙන් අනතුරුව ඔවුන් ඊළඟට කාට එරෙහිව නැඟී සිටීදැයි යන්න පිළිබඳව කිසිවකුත් අවධානය යොමු නොකළ බවයි ඔහු වැඩිදුරටත් සඳහන් කළේ.
මේ නිසා ලෝක ත්‍රස්තවාදය මර්ධනය කිරීමට නම් සියලු දුර්වලතාවලට විසඳුම් සහිත පැහැදිළි නිර්වචනයක් යටතේ හොඳ විසඳුමකට එළඹිය යුතු වෙනවා. ඒ සඳහා පුළුල් සංවාදයක් අවශ්‍යයි. 1991 දී ගල්ෆ් යුද්ධය සිදුවූවාට පසුව එවකට සිටි බටහිර වියතෙකු වූ ආන්ද්‍රෙව් ගුන්දර්ෆ්‍රැන්ක් සඳහන් කළා මෙම ප්‍රහාරය හරහා අනාගතයේ දී බරපතල ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවිය හැකි බව. අද වන විට එය සැබෑ වී තිබෙනවා. එබැවින් මේ සඳහා පිළියම් සෙවීමේ දී අනාගතය ගැනත් කල්පනා කළ යුතුමයි.
මෙම ප්‍රහාර මර්ධනය කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග ගැනත් මෙහි දී සඳහන් කළ යුතුමයි. ජුලි 7 ප්‍රහාරයෙන් පසුව සිදුකෙරුණු ජුලි 21 අසාර්ථක ප්‍රහාරයෙන් අනතුරුව ලන්ඩන් පොලිසිය උමං දුම්රියපළක් වැටලුවා. එහි දී ඔවුන් සැකකරුවෙක් යැයි කියා අහිංසක බ්‍රසීල ජාතිකයෙක්ගේ හිසට 8 වරක් හිස තබා ඝාතනය කලා. පසු ව මෙය අත්වැරැදීමක් බවට බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයා පවා පිළිගෙන තිබුණා. එහෙත්, ඔහු කියා තිබුණේ ත්‍රස්තවාදය මර්ධනය කිරීමේ දී එවැනි වැරැදීම් සිදුවිය හැකි බවයි. මෙවැන්නක් ශ්‍රී ලංකාවේ දී සිදුවූවා නම් කුමකින් කුමක් වෙයි ද? බටහිර රටවල් ඔවුන්ගේ මුදල් මත යැපෙන විවිධ සංවිධාන මොන තරම් චෝදනා කරයි ද? මානව හිමිකම් කඩවූවා, ආරක්ෂක අංශ ම්ලේච්ඡ ලෙස ක්‍රියා කළා ආදී වශයෙන් කොතරම් ඝෝෂා කරයි ද? මෙය කොතරම් පරස්පර ස්වභාවයක් ද? මේ දෙබිඩි පිළිවෙත ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනට බාධාවක් බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. ත්‍රස්තවාදය පරාජය කිරීමට නම් අනිවාර්‍යයෙන් ම මේ දෙබිඩි පිළිවෙත ද වෙනස් විය යුතු ම ය. එසේ නොවන්නේ නම් ප්‍රශ්නය විසඳෙනවා නොව තවතවත් උග්‍ර වෙනවා නියතය. ■

Raigam
Satisfying your taste buds!
කොහෙන්ද කොහෙන්ද අපි රයිගම් ගන්නේ?
දැන් මෙල්බන් උතුරු හා උතුරු බටහිර සෑම ප්‍රධාන ශ්‍රී ලාංකික වෙළඳ සැලකින්මත් රයිගම් නිශ්පාදන ලබා ගන්න ඔබට පුළුවන්!
1) Asian Spice World - St Albans
2) Paradise Groceries, Broadway, Reservoir
3) KML Enterprises, Craigeburn,
4) Tropical Island, Broadmeadows
5) Sri Lankan & Indian Groceries, Moonee Ponds (Fiji Shop)
රයිගම් සෝයා රස රැසකින්, රයිගම් නූඩ්ල්ස්, රයිගම් ඉදිආප්ප පිටි, රයිගම් කෝපි, රයිගම් විජලනය කල එළවළු,රයිගම් විනාකිරි, රයිගම් තුනපහ ඇතුළු රසයෙන් හා ගුණයෙන් පිරි නිපැයුම් රැසක්!
(Look for AU-EXPORT machine print- The sign of Australian quality)
TRY SOMETHING DELICIOUSLY DIFFERENT!!!
රස හඳුනන්නෝ රයිගම් ගන්නෝ!
Wholesale & Customer Service 03-9700 2100
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, PO Box 87, VIC 3039
Email:sales@etechno.com.au FAX -03-9337

PRINCE IMPORTERS
Sole Agents For Red Ruby Food Products in Australia
RED RUBY
අනර්ඝත්වයෙන් අගතැන් පත්
රෙඩ් රූබි නිෂ්පාදන
තොග විමසීම්
Red Ruby
The trusted trade mark for quality food products
පපඩම්
කරි පව්ඩර්
වියලි මිරිස්
ඉන්දියන් බාස්මතී
ඉන්දියන් සෝයාමීට්
රතු හාල්
2 Dight Avenue Balwyn North Victoria 3104
Tel: 9859 9246 Fax : 9859 4135 Mobile : 0403 199 061